**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2022

අප්‍රේල් - 2024

**BMGT E1015 - කළමනාකරණ මූලධර්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

ප්‍රශ්න අංක 01 ඇතුළු ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

ප්‍රශ්න අංක 01

පහත සඳහන් උපකල්පිත සිද්ධිය කියවා එහි අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

"මුකේෂ්ගේ උභතෝකෝටිකය"

ආර්ථික අවපාතයත් සමග, රට එහි තීරනාත්මක හිඟයෙන් මිදී ඇතත් එමගින් ඇති වන්නා වූ සෘණාත්මක බලපෑම් වලින් පැන නගින අඛණ්ඩ ව්‍යාපාරික ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීමට සේවකයින් 100ක් සිටින ආයතනයක කළමනාකරණ අධ්‍යක්ෂක වන මුකේෂ් ඔබව උපදේශකයෙකු වශයෙන් තම සමාගමට බඳවාගෙන ඇත. අයහපත් ආර්ථිකයේ බලපෑම් හේතුවෙන් මේ වසරේ ආරම්භයේ සිට වසරක කාලයක් පුරා ආයතනයේ සමස්ත ආදායම 20% කින් පහත වැටීමක් පුරෝකථනය කළ බව උපදේශක වශයෙන් ඔබ සොයා ගන්නා ලදී. තවද, මෙම කාලය තුළ ආයතනයෙන් ඉල්ලා අස්වීමට සිටිනා සේවකයින් 20 දෙනෙකු හඳුනා ගෙන ඇත. සුබසාධන වියදම් ද 15% කින් ඉහළ යනු ඇතැයි සමාගම අනාවැකි ද පළ කර තිබිණි. එපමණක් නොව තෝරාගත් දිරිගැන්වීම් සම්පූර්ණයෙන්ම කපා හැරීමටද, පූර්ණ කාලීන රැකියා 50% කින් අඩු කර කොන්ත්‍රාත් පදනම මත රැකියා ලබා දීමටද ආයතනය සැලසුම් කර ඇති බව ඔබ තවදුරටත් හඳුනා ගෙන ඇත . මෙම තොරතුරු සමග, වාර්තා සහ තත්වයන් නිසි ලෙස විමර්ශනය කිරීමෙන් අනතුරුව උපදේශක වශයෙන් ඔබ එම ආයතනයට අදාළ පුරෝකථන සහ සැලසුම් ආරම්භයේ සිටම සේවකයින් දැන සිටි බව හඳුනා ගන්නා ලදී. එපමණක් නොව, පසුගිය මාස දහය තුළ සමාගමේ ආදායම 35% කින්

පහත වැටී ඇති අතර සේවකයෝ 55 දෙනෙක් ආයතනයෙන් ඉවත් වී ඇත. එපමණක් නොව ආයතනයේ සැබෑ සුබසාධන පිරිවැය 20% කින් ඉහළ ගොස් ඇත. දිරි දීමනා කපාහැරීම සහ සේවකයින් කොන්ත්‍රාත් පදනම මත වැඩ කිරීමට කරන ලද ඉල්ලීම යන තීරණ දෙකම ආයතනයේ විකුණුම් සහ සේවකයින් රඳවා තබාගැනීම කෙරෙහි විශාල වශයෙන් බලපාන බව ද උපදේශකයවරයා ලෙස ඔබ සොයා ගන්නා ලදී.

ආයතනයේ පුරෝකථනයන් නිසි සාක්ෂි මත පදනම් වී නොමැති බව ද, ප්‍රධාන වශයෙන් කළමනාකරණ අධ්‍යක්ෂකගේ පක්ෂග්‍රාහීත්වය සහ තවත් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ අනාවැකි කිහිපයක් මත පදනම්ව ක්‍රියාමාර්ග ගෙන ඇති බව තවදුරටත් අනාවරණය විය.

කළමනාකරණ අධ්‍යක්ෂක මහතා, ඔහුගේ උසස් අධ්‍යාපනය අතරමගදී හැර ගොස් ඇති නමුත් ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විවිධ ව්‍යාපාරවල බොහෝ පෘථුල අත්දැකීම් සහිතව මනාව හැඩගැසී සිටියේය. මූල්‍ය, අලෙවිකරණය, මානව සම්පත් සහ නිෂ්පාදනය සඳහා බඳවා ගන්නා කළමනාකරුවන්ටද ඔවුන්ගේ ක්ෂේත්‍රයේ අත්දැකීම ඇතත්, උසස් අධ්‍යාපනයක් ලබා නැත. මෑතකදී ඉවත් වූ සේවකයින් ප්‍රධාන වශයෙන් අලුතින් බඳවා ගත් පළමු උපාධි ලබා ඇති විධායක ශ්‍රේණියේ සේවකයින් සහ කළමනාකරුවන් වන අතර ඔවුන්ගෙන් කිහිප දෙනෙකුට ශාස්ත්‍රපති උපාධි ද ඇත.

ඔබ ඉහත සඳහන් කළ තොරතුරු මුලින් සොයා ගෙන තිබුණද, තවමත් සමාගමේ සැබෑ ගැටලුව කුමක්ද සහ ලබා දිය යුතු විසඳුම් මොනවාද යන්න නිවැරදිව සොයා ගැනීමට ඔබට අදහසක් නැත.

පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න ꞉

අ) ඉහත සිද්ධියේ විස්තර කර ඇති ප්‍රතිවිපාක සලකා බැලීමේදී, ආයතනය දැනට මුහුණ දෙන ගැටළුව/ගැටළු මොනවාදැයි හඳුනා ගන්න

(ලකුණු 08)

ආ) "අ" කොටස තුළ ඔබ හඳුනාගත් ගැටළුව/ගැටළු වලට තුඩු දුන් මූලික ගැටළුව කුමක්ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 10)

ඇ) ආයතනයේ උපදේශකයා වශයෙන්, ඔබ ආයතනයේ හඳුනා ගත් මූලික ගැටළුව විසඳා ගැනීමට උපදෙස් දෙන ආකාරය පැහැදිලි කරන්න (උපකල්පන ඇත්නම් භාවිතා කරන්න).

(ලකුණු 10)

(මුළු ලකුණු 28)

ප්‍රශ්න අංක 02

ආ) උදාහරණයක් භාවිතා කරමින්, එක් එක් පාරිසරික කොටසෙහි අවම වශයෙන් අයිතම දෙකක්වත් ඉස්මතු කරමින් ආයතනික පරිසරය සඳහා වර්ගීකරණයක් සපයන්න.

(ලකුණු 06)

ආ) ශදූඅත විශ්ලේෂණය පදනම් කොටගෙන, උදාහරණයක් භාවිතා කරමින්, තෝරාගත් සංවිධානයක ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන අවම වශයෙන් තුන (03) බැගින් සඳහන් කර පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 18)

ප්‍රශ්න අංක 03

අ) සැලසුම්කරණය කළමනාකරණයේ හදවත බවට පත්වන්නේ ඇයි? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 09)

ආ) උදාහරණයක් භාවිතා කරමින් සැලසුම්කරණ සහ පාලන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

ප්‍රශ්න අංක 04

අ) කළමනාකරණ ශ්‍රිතයක් ලෙස 'සංවිධානකරණය' යන යෙදුමේ තේරුම විස්තර කරන්න.

(ලකුණු 03)

ආ) කළමනාකරණයේදී නිසි සංවිධානාත්මක ක්‍රියාවලියක වැදගත්කම කුමක්ද?

(ලකුණු 05)

ඇ) සංවිධාන ක්‍රියාවලිය එහි ප්‍රධාන අවධීන් ඉස්මතු කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 18)

ප්‍රශ්න අංක 05

අ) කළමනාකරණයේ ඕනෑම චින්තනයන් හතරක් ලියා දක්වන්න.

(ලකුණු 04)

ආ) කළමනාකරණ චින්තනයන් අධ්‍යයනය කිරීමේ අරමුණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) පහත සඳහන් කළමනාකරණයේ චින්තනයන්, එහි දායකයින්, ඔවුන් විසින් ලබා දී ඇති දායකත්වය සහ ප්‍රායෝගික යෙදුම් යන නිර්ණායක තුන යටතේ පැහැදිලි කරන්න.

i. සම්භාව්‍ය කළමනාකරණය (Classical Management)

ii. නව සම්භාව්‍ය කළමනාකරණය (Neo-classical Management)

iii. නවීන කළමනාකරණය (Modern Management )

(ලකුණු 08)

(මුළු ලකුණු 18)

ප්‍රශ්න අංක 06

අ) ආයතන තුළ ඇති විධිමත් කණ්ඩායම් සහ අවිධිමත් කණ්ඩායම් සංසන්දනය කර වෙනස දක්වන්න.

(ලකුණු 04)

ආ) ඇතැම් කණ්ඩායම් අන් කණ්ඩායම් අභිබවා යන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) එක් එක් අදියරවල ලක්ෂණ සහ ගතිකත්වය සහ ඒවා කණ්ඩායම්වල සමස්ත සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරමින් බෲස් ටක්මන් විසින් යෝජනා කරන ලද කණ්ඩායම් සංවර්ධනයේ අවධීන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 18)

ප්‍රශ්න අංක 07

අ) නායකත්වය සහ කළමනාකරණය අතර වෙනස දක්වන්න.

(ලකුණු 04)

ආ) "ශ්‍රේෂ්ඨ නායකයින් බිහිවනවා මිස, සකස් වන්නේ නැත" යන ප්‍රකාශයට ඔබ එකඟද? සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ඇ) පරිවර්තනීය නායකත්වය සහ ගණුදෙණු නායකත්වය සංසන්දනය කර වෙනස්කම් දක්වා, එක් එක් ශෛලිය වඩාත් ඵලදායී විය හැකි අවස්ථා පිළිබඳ උදාහරණ සපයන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 18)

ප්‍රශ්න අංක 08

අ) විවිධ වාචික නොවන සන්නිවේදන වර්ග හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04)

ආ) කළමනාකරණ සන්දර්භය තුළ ඵලදායී සන්නිවේදනයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) කළමනාකරණයේදී හරස් සංස්කෘතික සන්නිවේදනය හා සම්බන්ධ අභියෝග සාකච්ඡා කරමින්, විවිධ වැඩ පරිසරයන් තුළ ඵලදායී සන්නිවේදනය සහතික කිරීම සඳහා කළමනාකරුවන්ට සංස්කෘතික වෙනස්කම් හැසිරවිය හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 18)